# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1779/38 - 2012 ඔක්තෝබර් මස 13 වැනි සෙනසුරාදා - 2012.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2012 ඔක්තෝබර් මස 14 වැනි දින සිට ආරම්භ වන මාස 04ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2012.07.19 දිනැති අංක 1767/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය, මගින් සීනි (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 17.01) සඳහා ප්‍රකාශිත අදාළ නියමයන් 2012 ඔක්තෝබර් මස 14 මස වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 ඔක්තෝබර් මස 13 වන දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතය* | *විස්තරය* | |
| 01. | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකල මසුන් | කි.ග්‍රෑමයකට 10% හෝ රු. 10 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |

1A - PG 001422 — 980 (2012/10)

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් | කි.ග්‍රෑමයකට 10% හෝ රු. 10 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| 2. | | 0305.59.20 | වියලු ලුණු නොදැමූ හාල්මැස්සන් | කි.ග්‍රෑමයකට රු. 10.00 |
| 3. | | 0305.59.90 | අනෙකුත් - කරවල | කි.ග්‍රෑමයකට රු. 75.00 |
| 4. | 17.01 | | ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | එකතු කරන ලද රස කාරක හෝ වර්ණක අඩංගු නොවූ ශුද්ධ නොකළ සීනි | |
| | | 1701.11 | උක් සීනි | කි.ග්‍රෑමයකට රු. 20.00 |
| | | 1701.12 | බීට් සීනි | කි.ග්‍රෑමයකට රු. 20.00 |
| | | | අනෙකුත් | |
| | | 1701.91 | එකතු කරන ලද රස කාරක හෝ වර්ණක අඩංගු | |
| | | 1701.91.10 | සීනි | කි.ග්‍රෑමයකට රු. 20.00 |
| | | 1701.91.90 | අනෙකුත් | කි.ග්‍රෑමයකට රු. 20.00 |
| | | 1701.99 | අනෙකුත් | කි.ග්‍රෑමයකට රු. 20.00 |
| | | 1701.99.10 | සුදු ස්ඵටිකකෘත උක් සීනි | කි.ග්‍රෑමයකට රු. 20.00 |
| | | 1701.99.20 | සුදු ස්ඵටිකකෘත බීට් සීනි | කි.ග්‍රෑමයකට රු. 20.00 |
| | | 1701.99.30 | අනෙකුත් සීනි | කි.ග්‍රෑමයකට රු. 20.00 |
| | | 1701.99.90 | අනෙකුත් | කි.ග්‍රෑමයකට රු. 20.00 |

11 - 511

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.